# ලෝක පාංශු දිනය 2022 (දෙසැම්බර් 05)

## "ආහාර උපදින්නේ පසෙනි "

## "Soils: Where food begins"

### ලෝක පාංශු දිනය - 2022 දෙසැම්බර් 05




එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය **(United Nations Food and Agriculture Organization)** මඟින් පාංශු සම්පත ආරක්ෂා කිරීම සහ තිරසාර ලෙස කළමනාකරණය කිරීමේ අරමුණින් සෑම වසරකම දෙසැම්බර් 05 වන දින ලෝක පාංශු දිනය සමරනු ලැබේ. මෙම දිනය සැමරීම පිළිබඳව ජාත්‍යන්තර පාංශු විද්‍යා සංගමය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන්ට 2013 පැවති එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධාන සමුළුවේදී අනුමැතිය ලබාදී ඇත. එමෙන්ම, මෙම දිනය සැමරීම 2013 දෙසැම්බර් මස පැවති 68 වැනි එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසියේදී අනුමත කර ඇත. 2014 වර්ෂයේ ප්‍රථම පාංශු දින සැමරුම් උළලේ සිට ගෝලීය පාංශු හවුල්කාරීත්වය **(Global Soil Partnership)** විසින් පාංශු විශේෂඥයින් සහ මේ පිළිබඳව ඇල්ම දක්වන පුද්ගලයන්ගේ එකමුතුවෙන් එතැන් සිට ගෙවීගිය සෑම වසරකම පාංශු සංරක්ෂණ කාර්යයන් සඳහා දායකත්වය ලබා දී ඇත. ඒ අනුව, සෑම වසරකම විවිධ තේමා ඔස්සේ ලෝක පාංශු දිනය ලොව පුරා සමරනු ලබයි. 2022 වසරේ ලෝක පාංශු දින තේමාව වන්නේ "ආහාර උපදින්නේ පසෙනි " **(Soils: Where food begins)** යන්නයි.

### පරිසර අමාත්‍යාංශය විසින් 2022 ලෝක පාංශු දිනය සැමරීම සඳහා සිදු කරන ක්‍රියාකාරකම්

1. **ලෝක පාංශු දිනය පදනම් කරගෙන ශ්‍රී ලංකා පාංශු විද්‍යා සංගමය විසින් මධ්‍යම පළාතේ පාසල් සිසුන් කේන්ද්‍රගත කොට ගෙන පවත්වනු ලබන දැනුම මිනුම තරඟාවලිය සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම**

මෙවර පාංශු දිනය සැමරීම පාදක කරගනිමින් ආහාර සුරක්ෂිතතාවයට පසෙහි දායකත්වය මෙන්ම පස ජීවය පවත්වා ගැනීමට දක්වන දායකත්වය පිළිබඳව පාසල් දූවාදරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට ශ්‍රී ලංකා පාංශු විද්‍යා සංගමය විසින් සැලසුම් කර ඇත. මෙම වැඩසටහනේ දී මධ්‍යම පළාතට අයත් මහනුවර, මාතලේ හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල පාසල් සිසුදරු දැරියන්ට පසෙහි ඇති වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමේ දැනුම මිනුම තරඟාවලියක් පවත්වා ජයග්‍රාහී පාසල් තුනක් සඳහා ත්‍යාග පිරිනැමීමට කටයුතු සංවිධානය කර ඇත. මේ සඳහා මූල්‍යමය අනුග්‍රහය සපයනු ලබන්නේ පරිසර අමාත්‍යාංශය හා දකුණු ආසියාතික සහයෝගීතා පාරිසරික වැඩසටහන (SACEP) යටතේ ක්‍රියාත්මක කරනු ලබන සුවදායී භූමි දර්ශන ව්‍යාපෘතිය (Healthy Landscape Project) මඟිනි.

2. **අනුරාධපුර තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රාජ්‍ය ආයතනික නිලධාරීන් සඳහා තිරසර භූමි කළමනාකරණය,ආහාර සුරක්ෂිතතාවය හා පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සුවදායී භූමි දර්ශන ව්‍යාපෘතිය (Healthy Landscape Project) පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.**

තිරසර භූමි කළමනාකරණය, තිරසර කෘෂිකාර්මික ක්‍රම හා එය අහාර සුරක්ෂිතතාවට බලපාන ආකාරය පිළිබඳව අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ, වනජීවී, වාරිමාර්ග වැනි රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022 දෙසැම්බර් 09 දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.මේ හා සමගාමීව පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන වන සුවදායී භූමි දර්ශන ව්‍යාපෘතිය(Healthy Landscape Project) පිළිබඳව දැනුවත් කිරීමේ දේශනයක් ද සිදු කිරීමට නියමිතය. තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වැව් කිහිපයකම ප්‍රතිසංස්කරණ කටයුතු මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකරමින් පවතින නිසාවෙන් ඒ පිළිබඳව අදාළ නිලධාරීන් හා ජනතාව දැනුවත් කිරීම මෙහි අරමුණ වේ. මෙම වැඩසටහනෙහි සම්පත් දායකයින් වශයෙන් කටයුතු කරන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ, පාංශු විද්‍යා අධ්‍යනාංශයේ මහාචාර්යවරුන් දෙදෙනෙකු හා සුවදායී භූමි දර්ශන ව්‍යාපෘතියේ ජාතික ව්‍යාපෘති කලමනාකාරතුමා වන අතර මූල්‍ය දායකත්වය උසුලනු ලබන්නේ සුවදායී භූමි දර්ශන ව්‍යාපෘතිය මඟිනි.

## අහාරවල උපත සිදුවන පසෙහි ඇති වැදගත්කම

පෘථිවි තලයේ ජීවය බිහිවූ දා පටන් ශාක හා සත්ත්ව සංහතියේ පැවැත්ම තිර කිරීමෙහි ලා මාහැඟි මෙහෙයක් ඉටු කරන ලැබූ ස්වාභාවික සම්පතක් වශයෙන් පස හැඳින්විය හැකිය. පාංශු සම්පත ශිලා ගෝලයේ මතුපිට තුනී ස්ථරයක්ව පවතින අතර ස්ථානයෙන් ස්ථානයට පාංශු ස්ථරයේ ඝනකම වෙනස් වේ. පෘථිවි තලයේ වැඩි ප්‍රදේශයක් ආවරණය කරන්නා වූ පස ඛනිජ කොටස්, කාබනික ද්‍රව්‍ය, ජීවීන්, වාතය හා ජලය යන කොටස් වලින් සමන්විත වේ. ශාක සහ සතුන් යන අප අවට පරිසරයේ සිල්ලම දරා සිටින්නේ පසයි.

අප විසින් පරිභෝජනය කරනු ලබන ආහාරවලින් 95% ක් පමණ .ලැබෙන්නේ පසෙනි. අපගේ පැවැත්මට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථයන් ගබඩා කිරීම, පරිවර්තනය කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම යන කාර්යයන් සිදු කිරීම සඳහා පසට අසාමාන්‍ය හැකියාවක් ඇත. ශාක සඳහා අත්‍යවශ්‍ය පෝෂ්‍ය පදාර්ථයන් 18 න් 15 ක් ම සපයනු ලබන්නේ පස විසිනි. එම පෝෂ්‍ය පදාර්ථයන් සෞඛ්‍ය සම්පන්න වේ නම් බෝග අස්වනු වැඩිවීම සිදුවන අතර අස්වනු මඟින් නිෂ්පාදනය කරගනු ලබන්නා වූ අහාරවල ද පෝෂ්‍ය ගුණය ඉහළ මට්ටමක පවතී. සාර්ව හා ක්ෂුද්‍ර පෝෂක ඇතුළු මූලික පෝෂ්‍ය පදාර්ථයන් හිඟවීම ශාකයක වර්ධනය මෙන්ම අස්වැන්නේ ප්‍රමාණය ද අඩුවන අතරම ඌන පෝෂණ ආහාර මේ නිසා පරිභෝජනය කිරීමට සිදුවේ. දැනටමත් ලොව පුරා මෙම



හේතුව නිසාවෙන් බිලියන 02 ආසන්න ජනතාවක් සැගවුණු කුසගින්නෙන් පෙලෙන බව දත්ත වාර්තා සපයයි.

පස ලෝකයේ අවදානමට ලක්විය හැකි සම්පත් වලින් එකක් බවට හඳුනාගෙන ඇත. මෙම පස මත පිහිටා තිබෙන වනාන්තර, ශාක හේතුවෙන් පස ආරක්ෂා වී පැවතුනත් කෘෂිකාර්මික කටයුතු සඳහා ශාක ඉවත් කිරීම, බෝග වර්ග සිටුවීම හා බෝග වර්ගවලට පොහොර හා වෙනත් කෘෂි රසායන වර්ගයන් යෙදීම, ජල සම්පාදන කටයුතු වැනි මානව ක්‍රියාකාරම් පසේ පිරිහීමට හේතු සාධකයන් වේ. ශ්‍රී ලංකාවේ පමණක් නොව ගෝලීය වශයෙන් ද කෘෂිකර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන ඉඩම්වල පසේ සිදුවන පාංශු ඛාදනය, පසේ සාරවත්භාවය ක්ෂය වී යාම, ආම්ලීකරණය හා ලවණතාවය නිසාවෙන් පස පිහිරී යාම සිදුවී ඇති ආකාරය දැකිය හැකිය. සමස්ථයක් වශයෙන් ගත් කල්හි ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වලින් 50% ක් පමණ පාංශු ඛාදනය සිදුවන අතර එය ප්‍රධානතම පාංශු හායන ක්‍රියාවලියයි.

පස විශාලතම භූමියේ පවතින කාබන් තටාකයක් ලෙස සලකනු ලබන අතර ගතික ජෛව රසායනික ක්‍රියාවලීන් නියාමනය කිරීම හා වායුගෝලය සමඟ හරිතාගාර වායු හුවමාරු කිරීම මඟින් ගෝලීය කාබන් තුලිත කිරීමෙහි ලා සුවිශේෂී කාර්ය භාරයක් ඉටුකරනු ලබයි. පසෙහි ඉහලම මීටර් එකක කොටසක කාබන් ටොන් බිලියන 1460 ක් පමන අන්තර්ගත බව ඇස්තමේන්තු කර ඇති අතර එය වායුගෝලයේ හා වෘක්ෂලතාවල ගබඩා කර ඇති කාබන් ප්‍රමාණය මෙන් දෙගුණයකටත් වැඩි ප්‍රතිශතයකි.

පස තිරසාර ලෙස කළමනාකරණය කිරීමට නම් ගෝලීය පස නැවත කාබන්කරණය කිරීම සිදුකල යුතුය. ඒසේ නොමැති වුවහොත් දේශගුණ විපර්යාසයන් හි වේගවත් බව ලෝකයා වෙත නුදුරේදීම දැකිය හැකි සංසිද්ධියකි. කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන් හට විද්‍යාත්මක මෙන්ම දේශීය දැනුම ලබා දීම තුලින් රටකට ගැලපෙන තිරසාර පාංශු කලමනාකරණ ක්‍රමවේදයකට අනුගත කිරීම තුලින් පසෙහි සමතුලිතතාවය ආරක්ෂා වනු ඇත.

වර්තමානයේදී, ගෝලීය වශයෙන් ද පාංශු ඛාදනය, පස දූෂා වීම, ලවණිකරණය වැනි පාංශු හායනයවීමේ අභියෝගය රැසකට මුහුණ දෙමින් පවතී. මේ හේතුවෙන් පරිසර පද්ධති වල පැවැත්මට මෙන්ම ආහාර සුරක්ෂිතතාවයට ද දැඩි බලපෑමක් එල්ල වී ඇත. මෙම බලපෑම් අවම කර කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාවය ඉහල නැංවීම , නායයාම්, ගංවතුර වැනි ස්වාභාවික විපත් අවම කර ගැනීම , ජල විදුලි බලාගාරවල ජලාශ හා අනෙකුත් අභ්‍යන්තර ජලාශ ගොඩවීම අවම කරගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ පාංශු සංරක්ෂණ කටයුතු පෙරටත් වඩා යහපත් අන්දමින් කල යුතුව ඇත.